**මීගමුව මහා නගර සභාව - 2022**
**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 අහිතකර මතය

මීගමුව මහා නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට මීගමුව මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අහිතකර මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය  හැකි  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ  අවදානම්  හඳුනාගැනීම  හා තක්සේරු  කිරීම  සඳහා  අවස්ථාවෝචිතව උචිත විගණන  පරිපාටි  සැලැසුම්  කර  ක්‍රියාත්මක  කරන ලදී. වරදවා  දැක්වීම  හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන්  සිදුවන  බලපෑමට  වඩා වංචාවකින් සිදුවන්නා  වූ  බලපෑම  ප්‍රබල  වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා  වන  බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය  සහ  කළමනාකරණය  විසින්  කරන ලද  සම්බන්ධිත හෙළිදරව්  කිරීම්  අගයන  ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම  අගයන  ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ  කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව  විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව  ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | **අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති 141(i) රීතියටත්, ප්‍රමිතයේ 5.1.(අ) ඡේදයටත්, රීති 156 හා ප්‍රමිතයේ 6.2 ඡේදයටත් පටහැනිව සභාව විසින් 2022 වර්ෂය තුල රු.432,900 කට මිලදී ගෙන තිබූ තොග ලෙස හඳුනාගත යුතු අයිතම 12 ක් දේපල පිරියත ලෙස හඳුනාගෙන තිබුණි. | ඉදිරියේ දී මෙවැනි දෝෂ සිදු නොවීමට කටයුතු කරන බව. | රීති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) | ප්‍රමිතයෙහි පරිශිෂ්ඨ 2 හි සවිස්තරාත්මක පහදාදීම් හි EG 6.3 ඡේදයේ සඳහන් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලත් මුදල් ප්‍රවාහය ඉදිරිපත් කිරීමේ ක්‍රමයට පටහැනිව ජංගම නොවන ආයෝජනවල වර්ෂයේ ආරම්භක ශේෂයේ හා අවසාන ශේෂයේ රු.38,511,110 ක් වූ වෙනස ආයෝජනය සඳහා මුදල් යෙදවීම් ලෙස දක්වා තිබුණි. | -එම- | ප්‍රමිතවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඇ) | ප්‍රමිතයෙහි පරිශිෂ්ඨ 2 හි සවිස්තරාත්මක පහදාදීම් හි EG 6.3 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුලදී සභාවේ නිලධාරීන් වෙත රු.27,839,546 ක ණය ලබාදීම් ද රු.23,025,194 ක වාරික මුදල් හා රු.4,161,336 ක පොලී අයකිරීම් ද සිදු කර තිබුණු නමුත් එම වටිනාකම් ආයෝජන ක්‍රියාකාරකම් ලෙස දක්වා නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | ප්‍රමිත අංක 9.9 හා අංක 9.14 ඡේදවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේ ආදායමට හඳුනා නොගත් ප්‍රාග්ධන වියදම් දීමනා රු.85,302,075ක් ස්කන්ධය යටතේ නොපෙන්වා කෙටිකාලීන ගෙවියයුතු ඇ යටතේ දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දේපල පිරියත හා උපකරණ මිලදීගැනීම් රු.10,547,709 ක් වුවත් ආයෝජන ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය යටතේ එය රු.68,173,261 ක් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඊ) | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී LG 41/3 ආකෘතිය ප්‍රකාරව පළාත්පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත හි නිදර්ශනාත්මක ආකෘතියෙහි FS 3 අනුව සභාවෙහි 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම් සහ ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශයෙහි ඉකුත් වර්ෂයෙහි විස්තීර්ණ ආදායම ගැලපීමට පෙර සමුච්චිත අතිරික්තය රු.130,740,449 ක් ලෙස දැක්විය යුතු වුවද එය රු.112,444,953 ක් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |
| (උ) | ශුද්ධ වත්කම් සහ ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශයෙහි ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම් සහ පූර්ව කාලපරිච්ඡේදවල වැරදි ගැලපීමේ ශුද්ධ වටිනාකම රු.34,820,120 ක් වුවද එය රු.53,115,616ක් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඌ) | ප්‍රමිතයෙහි පරිශිෂ්ය 2 හි සවිස්තරාත්මක පහදාදීම් EG 6.2 ප්‍රකාරව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ජංගම වගකීම්වල රු.18,792,746ක වෙනස සභාව විසින් රු.37,549,122 ක් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |
| (එ) | ප්‍රමිතයෙහි පරිශිෂ්ය 2 හි සවිස්තරාත්මක පහදාදීම් EG 6.4 ප්‍රකාරව මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහ ගණනය කිරීමේදී ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු.36,110,911 ක් ලැබී තිබුණු නමුත් රු.48,072,182 ක් ලෙස රු.11,961,271 ක් වැඩියෙන් දක්වා තිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුල රු.31,176,000 ක් වූ දිගුකාලීන ණයගැනීම් මුදල් ප්‍රවාහයෙහි රු.70,016,000 ක් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඒ) | ප්‍රමිතයෙහි පරිශිෂ්ය 2 හි සවිස්තරාත්මක පහදාදීම් EG 6.2 ප්‍රකාරව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහයෙහි වර්ෂය සඳහා අතිරික්තයට ණය පොලී වියදම රු.8,612,223ක් හා පොලී ආදායම රු.10,552,079 ක් ගැලපීම් සිදුකර ඊට අදාල මුදලින් ගනුදෙනු වූ වටිනාකම් ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ වෙන වෙනම දැක්විය යුතු වුවත් එසේ දක්වා නොතිබුණි. | -එම- | -එම- |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුලදී රු.654,000 ක් වූ පරිගණක 2ක් හා රු.1,162,710 ක් වූ කාර්යාල උපකරණ එකතුව රු.1,816,710ක ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම්, ප්‍රාග්ධන ප්‍රදාන හා ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කරනු වෙනුවට වියදම් හර කර සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. | 2023 වර්ෂයේ ජර්නල් සටහනක් මගින් නිවැරදි කර ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට ගලපන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී දේශීය ණය සංවර්ධන අරමුදලින් ලැබී තිබුණු රු.31,176,000 ක ණය මුදල වෙනත් පුනරාවර්ථන වියදම් සඳහා ලැබීම් යටතේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිවැරදි කිරීමේදී අදාල ආදායම් ගිණුම හර කරනු වෙනුවට සමුච්චිත අරමුදල් ගිණුම හර කර තිබුණි. | ඉදිරියේ දී මෙවැනි දෝෂ සිදු නොවීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | දේශීය ණය සංවර්ධන අරමුදලින් හා සභා අරමුදලින් පුස්තකාල ගොඩනැගිල්ල සඳහා සමාලෝචිත වර්ෂයේදී දැරූ රු.80,763,837 ක වියදමක් පුනරාවර්තන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ප්‍රාග්ධන වියදම් සඳහා කරනු ලබන ගෙවීම් ඉවත් කර විස්තීරණ ආදායම පිළියෙල කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඈ) | පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2022 දෙසැම්බර් 31 දින දක්වා සිදුකළ මුළු ගෙවීම වූ රු.187,384,163ක් නොනිමි වැඩ ලෙස දේපල පිරියත හා උපකරණ යටතේ ප්‍රාග්ධනික කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය සිදු කර වත්කම් ගිණුම නිවැරදිව මූල්‍ය ප්‍රකාශනයේ දැක්වීමට කටයුතු කරන බව. | -එම- |
| (ඉ) | දේශීය ණය සංවර්ධන අරමුදල මගින් ණය පදනම මත ලබාදී තිබුණු කම්පැක්ටර් රථ 5ක් සඳහා ඉකුත් වර්ෂයේදී ගෙවන ලද රු.29,853,600ක් වූ ණය වාරික වටිනාකම සමාලෝචිත වර්ෂයේදී සමුචිත අරමුදලට බැර කරනු වෙනුවට ප්‍රාග්ධන යෙදවුමෙන් ආදායමට දායක වීමේ ගිණුමට බැර කර තිබුණි. | ඉදිරියේදී වත්කම් ප්‍රාග්ධනිත කිරීමේ දී පෙර වර්ෂවල සිට පවත්වා ගෙන ගොස් ඇති ප්‍රාග්ධන යෙදුමෙන් ආදායමට දායකවීමේ ගිණුම ඉවත් කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඊ) | සභාව විසින් පැරණි ගිණුම් ක්‍රමය අනුව ප්‍රාග්ධන යෙදවුමෙන් ආදායමට දායක වීමේ ගිණුම මගින් රු.10,547,708 ක් වූ දේපල පිරියත හා උපකරණ ප්‍රාග්ධනිත කර තිබුණු හෙයින් එම ගිණුමෙහි වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩිවී තිබුණි. එසේ ප්‍රාග්ධනිත කර තිබූ දේපල පිරියත හා උපකරණ තුල රු.6,356,163 ක් වූ වටිනාකමක් ගබඩා නිකුතුවලින් වියදමක් ලෙසද ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේ දී වියදම් වලින් වත්කම් පිරිවැය අඩු නොකර සෘජුවම වත්කම් ප්‍රාග්ධන කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (උ) | 2022 දෙසැම්බර් 31 දිනට ගබඩා තොගයේ ඇතුලත් වාහන 3 ක වටිනාකම වූ රු.27,433,329 ක් ගබඩා තොගයෙන් ඉවත් කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ වාහන ප්‍රත්‍යාගණනයේදී එහි වටිනාකම රු.20,300,000 ක් ලෙස තක්සේරු කර දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. මේ නිසා ගබඩා තොගයේ වටිනාකම රු.27,433,329 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ ජර්නල් සටහනක් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (උ) | 2021 වර්ෂයේ විගණන ගාස්තු රු.1,632,000 ක් ගිණුම්ගතකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා වෙන්කිරීමක්ද සිදුකර නොතිබුණි. | 2022 වර්ෂය සඳහා වෙන්වූ ප්‍රතිපාදනවලින් 2020 වර්ෂයේ විගණන ගාස්තු ගෙවන ලද අතර 2021 වර්ෂය සඳහා වූ විගණන ගාස්තු 2023 වර්ෂය තුළදී ගෙවන බව. | -එම- |
| (ඌ) | කඩ බදුදීම්, පොදු වෙළඳපල කඩකුලී හා මස් කඩ ටෙන්ඩර් කුලී ඉදිරියට ලද රු.277,294 ක්, රු. 160,644ක් හා රු.8,376ක් හුවමාරු ගණුදෙනුවලින් ලැබිය යුතු දෑ වලින් අඩුකර දක්වා තිබුණු හෙයින් ලැබිය යුතු ශේෂය රු.446,314ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී හිඟය හා ඉදිරියට ලැබීම් ලෙස වෙන් කොට දක්වන බව. | -එම- |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ වැඩ අවසන් නොවූ හා ජෙනරේටරයක් මිලදී ගැනීම වෙනුවෙන් වූ ප්‍රාග්ධන ව්‍යාපෘති 6 කට අදාලව එකතුව රු.107,634,195 ක් නොනිමි ලෙස ප්‍රාග්ධනිත කරනු වෙනුවට පුනරාවර්ථන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියට නොනිමි වැඩ යටතේ පෙන්වීමට කටයුතු කරන බව. | -එම- |
| (ඔ) | සමාලෝචිත වර්ෂය තුලදී ව්‍යාපෘති 6 ක් සඳහා මධ්‍යම රජයෙන් ලද රු.1,822,490 වූ ප්‍රාග්ධන ප්‍රදාන තුල ව්‍යාපෘති 4 කට අදාලව රු.1,155,002 ක් වූ අලුත්වැඩියාකිරීම් වියදම් වියදමක් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට පාරවල් බෝක්කු හා පාලම් යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | 2023 වර්ෂයේ ජර්නල් සටහනක් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඕ) | සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති 3 කට අදාලව සිදු කර තිබූ රු. 116,424ක් වූ පුනරාවර්තන වියදම් පාරවල් බෝක්කු හා පාලම් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. | -එම- | -එම- |
| (ක) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කර තිබූ රු.95,920 ක් වූ ව්‍යාපෘති 6 කට හා 2021 වර්ෂයේ රු.11,865,351 ක්වූ ව්‍යාපෘති 17 කට අදාල ව්‍යාපෘති වැඩ අවසන් වුවද එම වටිනාකම් ණයහිමි ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේ දී මෙවැනි දෝෂ සිදු නොවීමට කටයුතු කරන බව . | -එම- |
| (ග) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබීම් සහ 2022 ජනවාරි 01 දිනට පැවති රු.37,229,894 ක් වූ ශේෂය ද ඇතුලත්ව 2022 දී ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් මුළු වටිනාකම රු. 85,302,075 ක් ලෙස දක්වා විස්තීර්ණ ආදායම ගණනය කර තිබූ නිසා විස්තීර්ණ ආදායම රු.37,229,894ක ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | අදාල වර්ෂයට ලද ප්‍රාග්ධන ප්‍රදාන පමණක් ඉදිරියේදී විස්තීරණ ආදායම සඳහා ගළපන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ච) | 2022 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචිය වෙනුවෙන් පුවත්පත් දැන්වීම් සඳහා වැය වූ රු.125,310 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස නොදක්වා සමුච්චිත අරමුදලට ගලපා තිබුණි. | වැරදීමකින් සමුච්චිතයෙන් ගෙවීම කර ඇති බව. | -එම- |
| (ජ) | සම්පත් ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානයේ වැඩ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට නිමකර තිබුණ ද ඒ සඳහා වැය වූ රු.32,503,669 ක් දේපල පිරියත උපකරණ යටතේ ගිණුම් ගත කර නොතිබුණි. | ඉදිරියේ දී ගොඩනැගිලි ප්‍රත්‍යාගණනයක් සිදුකර මෙම ගොඩනැගිල්ල ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව. | -එම- |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ උපලේඛන අනුව ගිණුම් ශේෂ 10 ක රු.33,355,440 ක් වූ නොසැසඳු වෙනසක් විය. | ඉදිරියේ දී සොයා බලා කටයුතු කරන බව. | වෙනස්කම්වලට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.239,992,014 ක් වූ ගිණුම් ශේෂ 14 ක් ලේඛන, උපලේඛන,ජර්නල් සටහන් හා ශේෂ සනාථන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි සැපයීමට කටයුතු කළ යුතුය. |

1.7 **අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (I) | මු රෙ 371(5) | අවස්ථා 83 දී සභාවේ නිලධාරීන් සඳහා ලබා දී තිබුණු රු.2,259,142 ක් වූ අතුරු අග්‍රිම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් | මෙතෙක් නිරවුල් නොවූ අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. | යොමුගත රීතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | | |
| (II) | මු රෙ 486 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.880,169 කට අදාළ අගරු චෙක්පත් 54ක් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අගරු චෙක්පත් ලේඛනයේ අවුරුදු දහයකට වඩා පැරණි ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු සිදු කරන බව. | -එම- |
| (III) | මු රෙ 571(2) | රු. 8,783,870 ක් වූ වර්ෂ 2 ඉකුත් තැන්පතු 168ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | වර්ෂ ක් ඉකුත් තැන්පත් 02 ආදායමට ගැනීම සඳහා 2022 අදාළ අංශ වෙතින් වර්ෂයේ විමසීම් කළ ද එම තැන්පත් මුදල් තවදුරටත් තැන්පත් ලේඛනවල තබාගත යුතු බව. | -එම- |
| (IV) | මු රෙ 880 | සභාවේ ප්‍රජාශාලා භාරකරුවන් හැර අනෙකුත් නිලධාරීන් ඇප තබා නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | -එම- |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2020 අගෝස්තු 24 දිනැති අංක LGD/09/2019(I) දරන චක්‍රලේඛය | සභාව විසින් අත්තිකාරම් ගිණුම් සීමාවන් අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | 2021 ජනවාරි 22 දිනැති අංක LGD/10A/4/න. ගි/2019 චක්‍රලේඛය 02 ඡේදය | සභාව විසින් වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී ශුද්ධ අගයේ ඇතිවන වෙනස්වීම් ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශයේ සංචිත හා වෙන් කිරීම් ලෙස වෙනම තීරුවක් යටතේ හඳුනාගත යුතු වුවත් සභාව විසින්, මෝටර් රථ පොත් වටිනාකම් ඉවත් කිරීමේදී දේපළ ඉවත් කිරීම් ලෙස රු.268,070,274 ක් හා මෝටර් රථ හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය දේපල මිලට ගැනීම් ලෙස රු.395,817,317 ක් සමුච්චිත අරමුදලට වෙන වෙනම ගලපා තිබුණි. | ඉදිරියේ දී නිවැරදිව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2021 පෙබරවාරි 12 දිනැති අංක LGD/10A/4/න.ගි | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ස්ථාවර වත්කම් වර්ග 14ක් යටතේ වර්ගීකරණය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ | මේ වන විට සභාව සතු වත්කම් ප්‍රත්‍යාගණනය සිදුකරමින් පවතින අතර ඉදිරි | යොමුගත ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| /2019 දරන පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය | මූල්‍ය ප්‍රකාශයේ රු.1,219,250 ක් වූ වත්කම් එම කාණ්ඩ වලින් කාණ්ඩ 9 ක් යටතේ වර්ග කර තිබූ අතර, පරිගණක හා උපාංග, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ලෙස දක්වා තිබුණි. | අවසාන ගිණුමට කාණ්ඩ අනුව වෙන් කර ඉදිරිපත් කරන බව. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.12,401,464ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.58,059,856ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | **2022** | | | | **2021** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | | **රු. '000** | **රු. '000** | **රු. '000** | **රු. '000** | **රු. '000** | **රු. '000** | **රු. '000** | **රු. '000** |
| (i) | වරිපනම් හා බදු | 166,010 | 173,466 | 150,839 | 22,627 | 164,406 | 170,789 | 137,087 | 33,703 |
| (ii) | කුලී | 96,552 | 72,777 | 71,667 | 1,110 | 77,082 | 49,692 | 37,058 | 12,634 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 16,722 | 16,861 | 16,851 | 10 | 13,812 | 14,479 | 14,495 | (17) |
| (iv) | වෙනත් ආදායම් | 932,912 | 739,011 | 730,397 | 8,614 | 694,977 | 593,808 | 682,842 | (89,034) |
| | | 1,212,196 | 1,002,115 | 969,754 | 32,361 | 950,277 | 828,768 | 871,482 | (42,714) |

2.2.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (I) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට 2020 වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු විනෝද බදු රු.138,510 ක් සභාව විසින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | හිඟ අයකර ගනිමින් සහන ලබා දීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (II) | 2022 ජනවාරි 01 දිනට කොච්චිකඩේ උප කාර්යාලයේ පැවති හිඟ ව්‍යාපාර බදු රු.3,067,661 ක් අතරින් සමාලෝචිත වර්ෂය තුලදී රු.700 ක් පමණක් අයකරගෙන තිබුණි. | -එම- | හිඟ ආදායම් එකතු කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **කුලී** | | |
| (I) | පොළ කුලී ලැබිය යුතු ලෙස වර්ෂ 10 කට පෙර සිට පැවත එන හිඟ ශේෂය වූ රු.1,018,536 ක් පිළිබඳ තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | පිළිතුරු ලබා දී නොමැත. | හිඟ ශේෂ හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (II) | හුවමාරු ගණුදෙනුවලින් ලැබිය යුතු දෑ යටතේ දක්වා තිබූ 1987 වර්ෂයේ සිට පැවත එන නිවාස යෝජනා ක්‍රම 3 ක නිවාස 81 ක් වෙනුවෙන් ලැබිය යුතු නිවාස කුලී රු.453,242ක ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |
| **(ඇ)** | **බලපත්‍ර ගාස්තු** | | |
| | 2022 ජනවාරි 01 දිනට කොච්චිකඩේ උප කාර්යාලයේ පැවති හිඟ වෙළඳ බලපත්‍ර ආදායම් රු.1,842,561 කින් සමාලෝචිත වර්ෂය තුලදී රු.2,025 ක් පමණක් අයකරගෙන තිබුණු හෙයින් හිඟ ආදායම් එකතු කිරීමේ ප්‍රගතිය අවම මට්ටමක පැවතිණි. | 2023.06.13 දින පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති හිඟ අයකරගැනීමේ රැස්වීමෙන් පසුව මෙම කරුණට පිළිතුරු ලබා දෙන බව. | -එම- |
| **(ඈ)** | **තානායම් කුලී** | | |
| | 2020 හා 2021 වර්ෂවලදී තානායම් වෙනුවෙන් ලැබිය යුතු රු.2,100,313 ක් සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | -එම- |
| **(ඉ)** | **යතුරු කාසි** | | |
| | වර්ෂ 5 කට අධික කාලයක සිට පැවත එන යතුරු කාසි මුදල් රු.5,838,059 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ රු.3,567,266 ක්වූ ගබඩා ණයහිමි ශේෂයෙන් රු.2,781,165 ක් 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අයත් ශේෂයක් වූ අතර එය මුළු ගබඩා ණයහිමි ශේෂයෙන් සියයට 78 ක් බව නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නොමැත. | ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1991 වර්ෂයේ සිට පැවතෙන දේපල තහනම් නිලධාරින් 7 දෙනෙකුගේ රු.305,904 ක වටිනාකම වූ ඇප තැන්පත් මුදලට අදාල ස්ථාවර තැන්පතු නිදහස් කර මිශ්‍ර තැන්පතු යටතේ තැන්පත් කර තිබුණි. | නිලධාරීන් දෙදෙනෙකුගේ තැන්පත් මුදල් හා පොලී මුදල් සහා ආදායමට ගැනීමට කටයුතු කරමින් පවතින බව. | එම තැන්පතු අදාල නිලධාරීන්ට ආපසු ලබා දිමට හෝ ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් අපහරණය සඳහා නිර්දේශිත වාහන අතරින් වාහන 2 ක වටිනාකම රු.2,400,000 ක් ලෙස ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අපහරණයට නිර්දේශිත වාහන වටිනාකම් පොත් වලින් ඉවත් කළ යුතුය. |

## 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුල මිලදී ගත් හා පරිත්‍යාග ලෙස ලද රු.16,611,626 ක් වූ වත්කම් 7 ක් විගණිත දින වන විටත් භාවිතයට නොගෙන ගබඩාව තුළ නිෂ්ක්‍රීයව පැවතිණි. | පිළිතුරු සපයා නොමැත. | වත්කම් මිලදී ගැනීමේදී අවශ්‍යතාවයන් අනුව මිලදී ගත යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නෙට් ප්ලස් ආධාර ක්‍රමය යටතේ ආරම්භ කළ සූර්ය පැනල ව්‍යාපෘතියේ තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත රු.31,800,000 කට පුද්ගලික ආයතනයක් වෙත ලංසුව ප්‍රදානය කර තිබූ අතර 2022 මැයි 31 දින වන විටත් ලංකා විදුලි පෞද්ගලික සමාගම මගින් විදුලි සම්බන්ධතාවය ලබා ගැනීම හැර අනෙකුත් වැඩ නිමකර ඇති බවට දන්වා තිබුණද 2023 මැයි 31 දින වන විටත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක තත්ත්වයට පත්කර නොතිබුණි. | අනපේක්ෂිත ලෙස වියදම් ඉහළ යාම නිසා ගෙවීම් ප්‍රමාද වීම නිසා අපේක්ෂිත කාල සීමාවේදී නිම කිරීමට නොහැකි වූ බව. | ව්‍යාපෘති පිළිබඳ අධීක්ෂණයක් සිදුකර ව්‍යාපෘතිය ක්‍රියාත්මක තත්ත්වයට පත්කළ යුතුය. |
| (ආ) | 2022 වර්ෂය සඳහා රු.9,276,007 ක් වැය කර විදුලි භාණ්ඩ මිලදී ගැනීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (I) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1, 2.5, 2.8.1 (ආ) යන මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබුණු හෙයින් 2022 වර්ෂය තුළ මිලදී ගෙන තිබූ 250W Sodium vapor bulb (screw) වර්ගයේ විදුලි බුබුලු 250 ක් සඳහා රු.37,500 ක් ද 37W-40W LED Screw bulb වර්ගයේ විදුලි බුබුලු 1000 ක් සඳහා රු.25,000 ක් ද වැඩියෙන් ගෙවා තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ක්‍රියා කළ යුතුය. |

| | | |
|---|---|---|
| (II) Trip Switch 30 A සඳහා ආයතන 6 කින් මිලගණන් එවා තිබූ අතර තාක්ෂණික ඇගයීම් කමිටුව වගකීම් කාලය විමසා සැසැඳීමක් සිදු නොකර අයිතමයක් රු.4,950 කට මිලදී ගැනීමට නිර්දේශ කර තිබුණද 2022 වර්ෂයේදී මෙම අයිතම 01 ක් රු.4,750 කට මිලදීගෙන තිබුණි. එම රු.4,750 ක මිල, මිල කැඳවූ එක් ආයතනයකින්වත් ඉදිරිපත් කරන ලද මිලක් නොවීය. | -එම- | -එම- |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාථමික මට්ටමේ තනතුරු 489 කින් සත්‍ය සේවක තනතුරු 337 ක් වූ අතර පුරප්පාඩු 152ක් ද අතිරේක සේවකයෙකුද සේවයේ නිරත වී තිබුණි. තවද දැනට සේවයේ නියුතු 413ක් වූ සේවක සංඛ්‍යාව තුල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව සේවයේ යොදවා තිබූ සේවක සංඛ්‍යාව ද 75 දෙනෙකු විය. | දක්වා ඇති පුරප්පාඩු හේතුවෙන් මෙම ආයතනයේ දෛනික රාජකාරි සඳහා බලපාන බව පළාත් පාලන කොමසාරිස් වෙත අවස්ථා කීපයකදීම ලිඛිතව න්වා ඇති අතර අවස්ථාද කීපයකදීම නිකුත් කරන ලද ලිපි හා චක්‍රලේඛ මඟින් බඳවා ගැනීම් තාවකාලිකව නවතා ඇත.එබැවින් ආයතනගත තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ අවස්ථාවන් මෙම ආයතන වෙත නොලැබුණු බව. | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාවේ සේවයේ නියුතුව සිට මිය ගිය නිලධාරින් 35 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,720,116 ක ණය ශේෂයක්, විශ්‍රාම ගිය නිලධාරින් 7 දෙනෙකුට අදාල රු.32,740 ක් වූ ණය ශේෂයක්, සභාවේ සේවය අතහැර ගිය නිලධාරින් 24 දෙනෙකුගෙන් අයකර ගත යුතු රු.1,222,106 ක් වූ ණය ශේෂයක් හා සභාවෙන් ස්ථාන මාරුවී ගිය නිලධාරින් 10 දෙනෙකුගෙන් අයවිය යුතුව පැවති රු.24,526 ක ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණයශේෂ අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | ශේෂ අයකර ගැනීමට හෝ කපා හැරීමට සභාව විසින් කටයුතු කළ යුතුය. |